
රුසියානු ජනකතාවක් ඇසුරින් නැවත කීවේ
ඒ. එන්. තෝල්ස්තෝයි
සිංහල පරිවර්තනය
මහින්ද සෙනරත් ගමගේ
කුළැඟිලි පුතා



ඉස්සර කාලේ එක වයසක ගොවියෙක් හා ගෙවිලියක් හිටියා. දවසක් මේ ගෙවිලිය ගෝවා කපද්දී සුළැඟිල්ල කැපිලා ගියා. ඈ බොහෝම පරිස්සමින් සුළැඟිල්ල රෙදි කැබැල්ලක ඔතලා මිටි බංකුව උඩින් තිබ්බා.

එක සැරේටම එයාට ඇහුණා හීන් අඬන සද්දයක්. ඈ රෙදි කෑල්ල දිග ඇරලා බැලුවා. මෙන්න බොලේ, රෙදි කෑල්ලේ පුංචිම පුංචි දරුවෙක්. එයා ඇගේ සුළැඟිල්ලට වඩා උස නෑ.

වයසක ගෙවිලිය හොඳටම පුදුම වුණා විතරක් නොවෙයි බයත් වුණා.
"කවුද බොලේ නුඹ ?"
"මං ඔයාගෙ පුතා. මං හැදුනේ ඔයාගෙ ඇඟිල්ලෙන්."
ඈ ඔහුව අතට අරන් හොඳට බැලුවා. ඔහු කොච්චර පුංචිද කියනවා නං ඇහැට පේන්නෙත් නැති තරම්. ඉතිං ඈ එයාට 'සඵැඟිබි පතා' කියලා කතා කළා.

ඉතිං මේ පුතා ඔවුන් එක්ක ජීවත් වුණා. එයා ටිකෙන් ටික ලොකු වුණා. ඒ කියන්නේ ඇඟ පතින් ලොකු වුණා නොවෙයි. ලොකු මහත් වුණු අනිත් හුඟක් අයට වඩා නුවණින් වැඩුණා කියන එකයි. දවසක් එයා අම්මට කතා කළා.

"කෝ තාත්තා ?"

"එයා හාන්න ගියා"

"එහෙනං මං ගිහින් එයාට උදව් කරන්නම්"

"හොඳා පලයං පුතේ"

පුතා කුඹුරට ඇවිත් කතා කළා. "සුබ දවසක් තාත්තේ!"
වයසක ගොවියා හැම පැත්තම බැලුවා. "මොන පුදුමයක් දෑ! කටහඬක් ඇහෙනවා. ඒත් කාවවත් පේන්න නෑ. කවුද මට කතා කළේ ?"
"මේ මං ඔයාගෙ පුංචි පුතා. මං ආවේ ඔයාට හාන්න උදව් කරන්න. තාත්තා වාඩිවෙලා විවේක අරගෙන, මොනවා හරි ටිකක් කන්න!"
වයසක ගොවියා හොඳටම සතුටු වෙලා දවල් කෑමට වාඩි වුණා. මේ අතරේ සුළැඟිලි පුතා අශ්වයාගේ කන ළඟට නැඟලා ඌ ලවා හාන්න පටන් ගත්තා.

ඒ අතරේ කෑ ගහලා තාත්තාට මෙහෙම කීවා. "කාට හරි මාව අයිති කර ගන්න ඕනෑ වුණොත් හොඳ ගාණක් ඉල්ලලා විකුණන්න. මං පාර වරද්ද ගන්නෙ නැතිව ආපහු ගෙදර එන්නම්."

එතකොට ම ගමේ මුලාදෑනියා පාර දිගේ ආවා. එයා හොඳටම පුදුම වුණා.

අශ්වයෙක් තනියෙන් නගුලක් අදිනවා. ඒත් කවුරුවත් පේන්න නෑ.
"මං මෙහෙම දෙයක් ජීවිතේට දැකලා නෑ. අශ්වයෙක් තනියම නගුලක් අදිනවා"
"තමුන්නාන්සෙගේ ඇස් පේන්නෙ නැද්ද ? මගේ පුතා නොවෑ හාන්නේ ' වයසක ගොවියා කීවා.
"එයාව මට විකුණනවා!"
"අපොයි බෑ එයාව විකුණන්න. එයා තමයි අපේ සතුටයි, සැනසුමයි."

"සීයේ ඒකාව මට විකුණාපං!"
"හොඳා එහෙනං, මට රූබල් දාහක් ඕනෑ!"
"මොනවා, එච්චරක්!"
"පේනවානේ, එයා බොහොම පුංචි වුණාට හරිම නිර්භීතයි. ඒ වගේම විශ්වාසවන්තයි!"
මුලාදෑනියා රූබල් දාහක් ගෙව්වා. ඊට පස්සේ ළමයාව සාක්කුවේ දාගෙන යන්න ගියා.



ඒත් සුළැඟිලි පුතා සාක්කුවේ හිලක් හදාගෙන බිමට පැනලා ගෙදර එන්න ආවා. ඒත් මඟදි රෑ බෝ වුණා.
එයා තණකොළ ගහක් යට හැංගිලා නිදා ගත්තා. ඒ අතරේ එතැනින් ගිය බඩගිනිකාර වෘකයෙක් එයාව ගිල්ලා.



සුළැඟිලි පුතාට කරදරයක් වුණේ නෑ. එයා කලබල නැතිව වෘකයාගේ බඩේ ඉඳගෙන හිටියා.

ඒත් වෘකයාට නම් කරදර පටන් ගත්තේ එතන ඉඳලයි. ඌ බැටළු රංචුවකට කුරුමානම් ඇල්ලුවා. ගොපල්ලා උන්නේ නිදාගෙන. වෘකයා එක පාරටම එක බැටළුවෙක් ළඟට පැන්නා. එතකොට ම සුළැඟිලි පුතා හයියෙන් බෙරිහන් දුන්නා.

"ගොපල්ලෝ නැඟිටිනවා. මෙන්න වෘකයෙක් බැටළුවන් කනවා!"
ගොපල්ලා නැඟිටලා පොල්ලක් අරගෙන, බල්ලොත් එක්ක වෘකයා පස්සේ එලෙව්වා. වෘකයා ගැලවුණේ යාන්තමින්!
මේ වැඩේ කීප වතාවක් ම සිද්ධ වුණා. වෘකයා කෑම නැතිව කෙට්ටු වුණා. අන්තිමේ ඌ සුළැඟිලි පුතාට බැගෑපත් වුණා.

"එළියට එනවා!"

"ඉස්සෙල්ලම මාව අපේ ගෙදරට ගෙනියනවා. එතකොට මං එළියට එන්නං"

වෘකයා වෙන මොනවා කරන්නද! ඉතිං ඌ ගමට දුවගෙන ආවා. ඇවිත් කෙළින් ම ගොවියාගේ ගෙදරට වැදුණා.



ඒ වෙලාවේ සුළැඟිලි පුතා වෘකයාගේ බඩෙන් එළියට පැන්නා.
වයසක ජෝඩුව වෘකයාට පහර දී මරා දැම්මා. ඒ අය වෘකයාව හම ගහලා පුංචි පුතාට අලුත් කබායක් මහලා දුන්නා.

# සුළැඟිලි පුතා


රුසියානු ජනකතාවක් ඇසුරින් නැවත කීවේ
ඒ. එන්. තෝල්ස්තෝයි

සිංහල පරිවර්තනය
මහින්ද සෙනරත් ගමගේ

සිතුවම්
පී. ජී. පොනොමරෙන්කෝ

පරිගණක පිටු සැකසුම
ගයානී නිලංකා ගලගෙදර

පළමු මුද්‍රණය - 2009

ISBN 978-955-1889- 29 -6

මිල - රු 100/=



**සයුරි ප්‍රකාශන**
අංක: 102/176 මත්තේගොඩ නිවාස සංකීර්ණය පාර මත්තේගොඩ
දුරකථන : 0115 - 676483 0715 181421
ෆැක්ස් : 0112 844961